ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රවෘත්ති සංස්කාරක **2024 පෙබරවාරි 21**

# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021 = 100) : 2024 ජනවාරි

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දුරකථනය: **011-2147414** ෆැක්ස්: **011-2877945** ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2024 ජනවාරි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 6.5%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2023 දෙසැම්බර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 4.2%ක් ලෙස වාර්තා විය. 2024 ජනවාරි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 1.9% ක හා ආහාර නොවන කාණ්ඩයේ 4.7%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. ආහාර කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2023 දෙසැම්බර් මාසයේදී 1.6% සිට 2024 ජනවාරි මාසයේදී 4.1% දක්වා වැඩිවී ඇති අතර, ආහාර නොවන කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2023 දෙසැම්බර් මාසයේදී 6.3% සිට 2024 ජනවාරි මාසයේදී 8.5% දක්වා වැඩි වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (2021=100) මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2023 දෙසැම්බර් මාසයේ 208.8ක් වූ දර්ශකාංකය, 2024 ජනවාරි මාසයේ දී 215.0 ක් දක්වා වැඩි වී ඇති බව වාර්තා විය. මෙය 2023 දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2024 ජනවාරි මාසයේ දර්ශකාංකය 6.2ක වැඩිවීමක් එනම් 2.93 ක ප්‍රතිශතාංක වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම මාසික වෙනස්වීම සඳහා ආහාර කාණ්ඩය 1.17% කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩය 1.76% කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකුවිට මිලෙහි වැඩිවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත්තේ එළවළු, ලොකුළූණු, අළුත් මාළු, අළුත් පළතුරු, පොල්, අමුමිරිස්, කරවල, කුකුළුමස්, සහල්, යෝගට්, බිත්තර, මුංඇට, කහකුඩු, පොල්තෙල් සහ තේ කුඩු/කොළ යන ආහාර ද්‍රව්‍යවල වේ. එහෙත් දෙහි, සීනි, අර්තාපල් සහ රතුළූණු යන ආහාර ද්‍රව්‍ය වල මිලෙහි අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2024 ජනවාරි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' *(නිවාස කුළිය හා එල්.පී.ගෑස්)*, 'ප්‍රවාහන' *(පෙට්‍රල්)*, 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' *(අරක්කු, සිගරට්)*, 'අධ්‍යාපන' *(අතිරේක පන්ති ගාස්තු)*, 'ආපනශාලා සහ හෝටල්', 'සන්නිවේදන' *(ජංගම දුරකථන ගාස්තු)*, 'විවිධ භාණ්ඩ හා සේවා' *(මෝටර් රථ රක්ෂණ ගාස්තු)*, 'සෞඛ්‍ය' *(විශේෂඥ වෛද්‍ය ගාස්තු)*, 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' *(මෙහෙකාර වැටුප්)*, 'විනෝදාත්මක හා සංස්කෘතික' සහ 'රෙදිපිළි හා පාවහන්' *(රෙදිපිළි)* යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පාද වර්ෂය: 2021=100) ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation), 2023 දෙසැම්බර් මාසයේ 0.9% සිට 2024 ජනවාරි මාසයේදී 2.2% දක්වා වැඩිවීමක් වාර්තා විය.




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2021 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| **2023** | ජන. | 201.8 | 232.8 | 181.8 | 189.8 | 0.7 | 1.0 | 53.2 | 53.6 | 52.9 | 52.0 |
| | පෙබ. | 204.1 | 228.1 | 188.6 | 189.4 | 1.1 | -0.2 | 53.6 | 49.0 | 57.4 | 50.1 |
| | මාර්තු | 204.8 | 223.2 | 193.0 | 188.1 | 0.3 | -0.7 | 49.2 | 42.3 | 54.9 | 44.2 |
| | අප්‍රේල් | 202.7 | 223.8 | 189.1 | 188.2 | -1.0 | 0.1 | 33.6 | 27.1 | 39.0 | 31.8 |
| | මැයි | 203.1 | 226.1 | 188.3 | 187.8 | 0.2 | -0.2 | 22.1 | 15.8 | 27.6 | 21.6 |
| | ජුනි | 203.3 | 228.4 | 187.1 | 186.5 | 0.1 | -0.7 | 10.8 | 2.5 | 18.3 | 11.3 |
| | ජූලි | 201.9 | 227.5 | 185.3 | 188.0 | -0.7 | 0.8 | 4.6 | -2.5 | 10.9 | 6.3 |
| | අගෝ. | 201.9 | 224.6 | 187.3 | 188.7 | 0.0 | 0.4 | 2.1 | -5.4 | 9.0 | 4.1 |
| | සැප්. | 203.5 | 226.7 | 188.5 | 189.0 | 0.8 | 0.2 | 0.8 | -5.2 | 5.9 | 1.7 |
| | ඔක්. | 203.6 | 224.1 | 190.4 | 189.2 | 0.0 | 0.1 | 1.0 | -5.2 | 6.3 | 0.6 |
| | නොවැ. | 206.0 | 228.1 | 191.8 | 189.3 | 1.2 | 0.1 | 2.8 | -2.2 | 7.1 | 0.8 |
| | දෙසැ. | 208.8 | 236.2 | 191.2 | 189.7 | 1.4 | 0.2 | 4.2 | 1.6 | 6.3 | 0.9 |
| **2024** | ජන. | 215.0 | 242.4 | 197.3 | 193.9 | 3.0 | 2.2 | 6.5 | 4.1 | 8.5 | 2.2 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව